# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2038/26 – 2017 සැප්තැම්බර් 27 වැනි බදාදා – 2017.09.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගන්දෙකේ කෝරළේ සුළු කොට්ඨාසයේ, පුස්සේ ඇළ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක මහ/යූඩීඩී/2014/523 හා 2014.11.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දැක්වෙන කැබලි අක්ෂර "ඒ"ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.4090 ක් පමණ වන පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – වින්ෆීල්ඩ්පාර්ක් වත්ත – ප්‍රමාණය: හෙක්. 0.4090**

උතුරට: රජය හිමිකම් කියන වින්ෆීල්ඩ්පාර්ක් වත්ත සහ මහදුරු ගෙදර පුංචා හිමිකම් කියන වින්ෆීල්ඩ්පාර්ක් වත්ත; නැගෙනහිරට: මහදුරු ගෙදර පුංචා හිමිකම් කියන වින්ෆීල්ඩ්පාර්ක් වත්ත සහ රජය හිමිකම් කියන වින්ෆීල්ඩ්පාර්ක් වත්ත; දකුණට සහ බටහිරට: රජය හිමිකම් කියන වින්ෆීල්ඩ්පාර්ක් වත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය : 4-3/2/2011/FR/354.
2017 අගෝස්තු මස 31 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 - 319


1A – G26315 – 12 (2017/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*